රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 16/92

මගේ අංකය: 1/643ඊ/08ඩී/01/92/1,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 මාර්තු මස 13 වෙනි දින.

**සියලුම:** අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්රුන්,
පළාත් සභාවල ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල ලේකම්වරුන් සහ
රාජ්‍ය සංස්ථා, රජයට අයත් ව්‍යාපාරික ආයතන සහ
රජයට අයත් සමාගම්වල සභාපතිවරු / නිසි බලධාරීන් වෙත.

**<u>උපාධි සහතික පිළිගැනීම.</u>**

බඳවා ගැනීම් සහ උසස් කිරීම් සඳහා උපාධි සහතික පිළිගැනීමේ දී පත් කිරීමේ බලධාරීන් විසින් විවිධ පිළිවෙත් අනුගමනය කරන බවට කරුණු ඉදිරිපත් වී ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් උපදෙස් නිකුත් කිරීමේ අවශ්‍යතාවය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මා වෙත පෙන්වා දී ඇත.

02. මෙහිලා පත් කිරීමේ බලධාරීන් විසින් පහත දැක්වෙන පරිදි ක්‍රියා කළ යුතුය.

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ පවතින ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලය ඇතුළුව අනෙකුත් විශ්ව විද්‍යාල මගින් පිරිනමනු ලබන සම මට්ටමේ උපාධි සමාන ලෙස සැලකිය යුතුය.

(ආ) එම උපාධි අභ්‍යන්තර හෝ බාහිර යන වෙනසකින් තොරව සමාන ලෙස සැලකිය යුතුය.

03. විවිධ ක්ෂේත්‍රවල විෂයයන් තෝරා ගැනීම සඳහා සිසුනට වැඩි අවස්ථාවක් සලසනු වස් විශ්වවිද්‍යාල ක්‍රමය සහ විශ්වවිද්‍යාල පාඨමාලා ප්‍රතිව්‍යුහගත කොට ඇති බැවින්, පුරප්පාඩු සඳහා නැවත දැන්වීම් පළ කිරීමට පෙර දැනට බඳවා ගැනීමේ පරිපාටිවල දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම්වල අඛණ්ඩව පවත්නා බව සම්බන්ධයෙන් ද, බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීමේ දී/ සංශෝධනය කිරීමේ දී ඒ ඒ ආයතනවලට පිළිගත හැකි නව අධ්‍යාපන සුදුසුකම් හඳුන්වාදීම සම්බන්ධයෙන් ද අදාල පත් කිරීමේ බලධාරීන් විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසිය යුතුය.

04. බඳවා ගැනීමේ පරිපාටියෙහි තනතුරට අදල අධ්‍යාපන සුදුසුකම් පැහැදිලිව සඳහන් විය යුතුය.

05. තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේ දී පත්කිරීමේ බලධාරීන් විසින්, අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් පැහැදිලි ලෙස දැන්වීමෙහි ඇතුළත් කළ යුතුය. උපාධි මට්ටමේ සුදුසුකමක් සඳහා අවශ්‍ය යම් විෂයයක් හෝ යම් විෂයය සංකලනයක් බඳවා ගැනීමේ පරිපාටියේ විශේෂයෙන් සඳහන් නොවන අවස්ථාවල දී_පත්කිරීමේ බලාධාරීන් වවිසින් යම් විශේෂ විෂයයකින් හෝ විෂයය සංකලණයකින් ලබා ගන්නා ලද සහතිකයකට තෝරා ගැනීම සීමා නොකළ යුතුය.

06. <u>**ඉන්දියාවේ විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් පිරිනමනු ලබන උපාධි.**</u>

ඉන්දියාවේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් පිරිනමනු ලබන උපාධි, එම ආයතන සහ ඒවායෙහි පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ වාර්ෂික සංග්‍රහයේ ( Association of commonwealth Universities Year Book) ලැයිස්තු ගත වී ඇත්නම් පිලිගනු ලැබේ.

**07. වෙනත් විශ්වවිද්‍යාලවල උපාධි.**

ඉහත විස්තර කොට ඇති රටවලට බාහිර වෙනත් රටවල විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන උපාධි පිලිගනු ලබන්නේ එම විශ්වවිද්‍යාල සහ උපාධි පෙර සඳහන් පොදු රාජ්‍ය මණ්ඩලික විශ්වවිද්‍යාල සංගමයේ වාර්ෂික සංග්‍රහයේ සහ / හෝ ජාත්‍යන්තර විශ්ව විද්‍යාල අත් පොතෙහි ( Association of commonwealth Universities Year and / or International Hand Book of Universities ) ලේඛණ ගත වන්නේ නම් පමණි.

08. කෙසේ වුව ද යම් විශ්වවිද්‍යාලයක් ඉහත සඳහන් පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්ව විද්‍යාල වාර්ෂික සංග්‍රහයේ සහ / හෝ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල අත් පොතෙහි ( Association of commonwealth Universities Year and / or International Hand Book of Universities ) සඳහන් නොවන අවස්ථාවක එම විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධිවල පිලිගැනීම සම්බන්ධ තීරණය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගනු ලබනු ඇත.

අ.කලේ/ ( එම්.එන්.ජුනයිඩ් )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.